මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: (94)-011-2484500, (94)-011-2484600, (94)-011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: (94)-011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: CGO/ASM/Policy/Cir/ (VOL II)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.10.02

**වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020**

සියලුම : අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
රාජ්‍ය බැංකු හා රාජ්‍ය සමාගම් සභාපතිවරුන්

**රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය**

**රාජ්‍ය ආයතනවලට අයත් ධාවන තත්ත්වයේ නොපවතින වාහන අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම**

රාජ්‍ය ආයතනවලට අයත් වාහන විශාල ප්‍රමාණයක් නිසි පරිදි නඩත්තු කිරීමකින් තොරව විවිධ ස්ථානවල ගාල්කර තිබෙන බව නිරීක්ෂණය වන බැවින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුලු සියලු රාජ්‍ය ආයතනවල ධාවන තත්ත්වයේ නොපවතින වාහන අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම කඩිනමින් සිදුකල යුතු බව 2020 සැප්තැම්බර් 02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

02. ඒ අනුව, සියළුම රාජ්‍ය ආයතනවලට අයත් නිසි පරිදි නඩත්තු කිරීමකින් තොරව ගාල්කර තිබෙන වාහන සම්බන්ධයෙන් අදාල ආයතන ප්‍රධානීන් විසින් පහත සඳහන් පරිදි කටයුතු කල යුතු වේ.

**අ). ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන අපහරණය කිරීම**

2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි I කොටසෙහි 13.2 ඡේදයට අදාල වන මාර්ගෝපදේශ අංක 03හි සඳහන් වන ක්‍රමවේදය අනුගමනය කර, ධාවන තත්ත්වයේ නොපවතින වාහන 2020.12.31 දිනට පෙර අපහරණය කල යුතුවේ. අයවැය ප්‍රතිපාදන හෝ පළාත් සභා අරමුදල් භාවිතා කරන ආයතන එම වාහන අපහරණය කිරීමෙන් උපයන මුදල් අදාල අරමුදල්වලට පහත සඳහන් පරිදි බැර කල යුතු වේ.

I අයවැය ශීර්ෂයක් සහිත ආයතන විසින් අපහරණ ක්‍රියාවලියෙන් උපයන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැරකිරීම සඳහා 20.06.02.01 ආදායම් ශීර්ෂය යටතේ ගිණුම්ගත කිරීම. අයවැය ශීර්ෂයක් නොමැති අයවැය ප්‍රතිපාදන මගින් මුදල් සපයාගනු ලබන ආයතන විසින් අපහරණ ක්‍රියාවලියෙන් උපයන ආදායම් රේඛීය අමාත්‍යාංශය හරහා ඒකාබද්ධ අරමුදලට බැර කිරීම.

II පළාත් සභා හා පළාත් සභාවලට අයත් ආයතන විසින් අපහරණ ක්‍රියාවලියෙන් උපයන ආදායම පළාත් සභා අරමුදලට බැර කිරීම.

**ආ) ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී වන වාහන අලුත්වැඩියා කිරීම**

2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි I කොටසෙහි 13.2 ඡේදයට අදාල වන මාර්ගෝපදේශ අංක 03හි සඳහන් විශේෂ කමිටුව මගින් ඉහත (අ) හි සඳහන් පරිදි අපහරණය කිරීම සඳහා සුදුසු වාහන හඳුනාගැනීමෙන් පසුව අලුත්වැඩියා කර භාවිතා කිරීම ඵලදායී වන වාහන ලෙස හඳුනාගනු ලබන දැනට ධාවන තත්ත්වයේ නොමැති වාහන සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කර 2020.12.31 දිනට පෙර අලුත්වැඩියා කල යුතුවේ.

I වාහන අලුත්වැඩියාව සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් සපයන ප්‍රතිපාදන අවශ්‍යවන ආයතන මේ සමඟ ඇති ඇමුණුම I හි සඳහන් තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ නිර්දේශය සහිතව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කලයුතු වේ.

II පළාත් සභා හා පළාත් සභාවලට අයත් ආයතන සතු එවැනි වාහන පළාත් සභා අරමුදල් භාවිතා කරමින් අලුත්වැඩියා කලයුතු වේ.

III අයවැය ප්‍රතිපාදන මගින් මුදල් සපයනු ලබන ආයතන සහ පළාත් සභා හා පළාත් සභාවලට අයත් ආයතන හැර අනිකුත් සියළුම රාජ්‍ය ආයතන සතු එවැනි වාහන අදාල ආයතනවල අරමුදල් භාවිතා කරමින් අලුත්වැඩියා කලයුතු වේ.

03. ඉහත 02හි සඳහන් පරිදි අපහරණය කල හෝ අලුත්වැඩියා කල වාහන පිළිබඳ තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා 2021.01.15 දිනට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත මේ සමඟ ඇති ඇමුණුම II හි සඳහන් පරිදි ඉදිරිපත් කලයුතු වේ. අයවැය ප්‍රතිපාදන භාවිතා කිරීමෙන් අලුත්වැඩියා කල වාහන පිළිබඳව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කිරීමෙන් පසු ප්‍රමාණවත් වාහන නොමැති රාජ්‍ය ආයතන සඳහා කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය මගින් විධිමත් පරිදි එම වාහන ලබාදීම සිදු කරනු ලැබේ.

**එස්.ආර්. ආටිගල**

**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:
1 ජනාධිපති ලේකම්
2 අග්‍රාමාත්‍ය ලේකම්
3 අමාත්‍ය මණ්ඩල ලේකම්
4 අයවැය අධ්‍යක්ෂ ජනරාල්
5 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්
6 විගණකාධිපති

ඇමුණුම I

**ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායී වන වාහන අලුත්වැඩියා කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන ඉල්ලීම**

**1. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනයේ නම : ....................................................**

**2. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

පහත සඳහන් ලියාපදිංචි අංක දරණ වාහන අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදලට අදාල ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

| අනු අංකය | ලියාපදිංචි අංකය | වාහන පංතිය (Car, Double Cab, etc.) | වර්ගය (Make) (Toyota, Nissan, etc.) | මාදිලිය (Model) (Corolla, Sunny, etc.) | නිෂ්පාදිත වර්ෂය | ධාවනය කර ඇති දුර ප්‍රමාණය(km) | ධාවන තත්ත්වයෙන් ඉවත් කර තිබූ කාලය(අවුරුදු/මාස) | අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු ගත මුදල (රු) | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| | | | | | | | | | |
| | | | | | | | | | |

........................................... ..........................

ආයතන ප්‍රධානියාගේ දිනය
අත්සන හා නිලමුද්‍රාව

**3. අමාත්‍යාංශ /රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

ඉහත නිර්දේශය අනුව, පහත සඳහන් ලියාපදිංචි අංක දරණ වාහන අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදලට අදාල ප්‍රතිපාදන ලබාදීම නිර්දේශ කර ඉදිරිපත් කරමි.

නිර්දේශිත වාහන: ..................................................

........................................... .................................

අමාත්‍යාංශ /රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ දිනය
අත්සන හා නිලමුද්‍රාව

**4. කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ නිර්දේශය**

අයවැය අධ්‍යක්ෂ ජනරාල්

ඉහත නිර්දේශය අනුව, පහත සඳහන් ලියාපදිංචි අංක දරණ වාහන අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදලට අදාල ප්‍රතිපාදන ලබාදීම නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

නිර්දේශිත වාහන: ..................................................

........................................... .................................

කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ දිනය
අත්සන හා නිලමුද්‍රාව

ඇමුණුම II

ධාවන තත්ත්වයේ නොපැවති අපහරණය කල හෝ අලුත්වැඩියා කල වාහන පිළිබඳ තොරතුරු වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 අනුව අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම

( පහත තොරතුරු ෆැක්ස් අංක 011 – 2151417 වෙතද, **Excel** මෘදු පිටපත cgo@mo.treasury.gov.lk විද්‍යුත් ලිපිනය වෙතද ඉදිරිපත් කලයුතු වේ).

**1.** අපහරණය කල වාහන පිළිබඳ තොරතුරු

| අනු අංකය | ලියාපදිංචි අංකය | වාහන පංතිය (Car, Double Cab, etc.) | වර්ගය (Make) (Toyota, Nissan, etc.) | මාදිලිය (Model) (Corolla, Sunny, etc.) | නිෂ්පාදිත වර්ෂය | අපහරණය කිරීම (√) | | අපහරණයෙන් ඉපයූ මුදල (රු) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | වාහන ලෙස | සුන්බුන් ලෙස | |
| | | | | | | | | |
| | | | | | | | | |

.............................................
ආයතන ප්‍රධානියාගේ

අත්සන හා නිලමුද්‍රාව

....................................
දිනය

**2.** අලුත්වැඩියා කල වාහන පිළිබඳ තොරතුරු

| අනු අංකය | ලියාපදිංචි අංකය | වාහන පංතිය (Car, Double Cab, etc.) | වර්ගය (Make) (Toyota, Nissan, etc.) | මාදිලිය (Model) (Corolla, Sunny, etc.) | නිෂ්පාදිත වර්ෂය | අලුත්වැඩියාව සඳහා වැයවූ මුදල (රු) |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

.............................................
ආයතන ප්‍රධානියාගේ

අත්සන හා නිලමුද්‍රාව

....................................
දිනය